# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ.) විභාගය

පැරණි නිර්දේශය

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය 2

**සිංහල 1** **71 S 1** **පැය තුනයි**

උපදෙස්

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

---

1. පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ). සමුණන් ලුහුබඳවාගෙන ගොසින් රඳවන්ට උත්සාහ කොටත් නො රඳා නික්මුණුවූ ය. සමුණෝත් කැටි ව නික්මුණ වූ ය. මෙසේ එක් ව යන කලට නො කල් නො වේලා කොටලා මහා වැස්සෙක් නැඟී ය. ඒ වේලාට ගසන විදුලියෙන් හා මේඝනාදයෙන් හා වසනා වැස්සෙන් ආකාශය අතුරු සිදුරු නැති විය. ඒ වේලාට ම පිට පිට හෙළා විදුලිය ගසන්නා සේ විලිත් පහරනට වන. ආස ගුගුරන්නා සේ හඬගසන්නටත් විලිත් පහරන්ට වන. ශීත වඩා බලවත් හෙයින් ඇල් වැදපියා විලිත් ලාගත නො හෙමි. නො තෙමී වදාපියන තැනක් ඉදිකරව'යි කිවූ ය. උයිත් දණ්ඩක් පතක් කපාගන්ට නිසි යකඩයක් හැරගෙන දඩුපත් බලා ඇවිදිනෝ තුඹසක් පිට සිටි කැලයක් දැක දණ්ඩක් පතක් කපන්ට වන්හ. ඒ කපන සොල්මනට තුඹසින් නයෙක් අවුත් ලා දඩු කපන තැනැත්තවූ කාපිය.

I. ප්‍රසව වේදනාව බලවත් වන ලෙසින් වර්ධනය වූ අනෙක් දේ කුමක් ද?

II. සිටු දුවණිය සිය ස්වාමියාට කුමක් ප්‍රකාශ කළේ ද?

III. නයා තුඹසින් ඒමට බලපෑ හේතුව කුමක් ද?

IV. "සමුණන්" , "බණුවාලා" යන වචනවලට අර්ථ සපයන්න. ( ලකුණු 04 යි.)

(ආ). ඕ තොමෝ මාර්ගෝපකරණාදිය සපයන පරිද්දෙන් පරිවාර ජනයනට විධාන කොට ගිණි දඬු ආදී උපකරණ ද අත්සුනු අග්ගලා ආදී මාර්ගෝපකරණ පයියෙහි බැහුයේ ය. මේ සියල්ල ම දසමුනක් පමණ ම බර වුයේ ය. සෝණුත්තර නම් වැදී පුත්‍ර ද තමාගේ ගෙයි කළමනා විධාන කොට සත්වෙනි දවස් අවුත් බිසවුන් වැඳලා සිටියේ ය. එවේලෙහි සුභද්‍රා තෙම 'සබඳ, වැදී පුත්‍රය, සියලු ම මාර්ගෝපකරණ සපයා නිමවන ලද. එබැවින් මේ සියලු පසුඹිය හැරගෙනව' යි කිව. ඇතුන් පස් දෙනෙකුට බල දරන්නා වූ එතෙම ඒ පසුඹි පයිය ඔසවා කිසිල්ල අස්සේ ගන්වා ගෙන සිස් අතින් සිටියාක් මෙන් සිටියේ ය. ඒකෙණෙහි චුල්ල සුභද්‍රාව වැදි පුත්‍රයාගේ බිරින්දට වැටුප් වියදමුත් දී රජ්ජුරුවන්ට දන්වා සෝණුත්තර නම් වැද්දවුට සමුදුන්නේ ය.

I. මාර්ගෝපකරණ ලෙස ගෙන ගිය දෑ මොනවා ද?

II. සියලු මාර්ගෝපකරණ ද්‍රව්‍ය කොපමණ බර වී ද?

III. වැදී පුත්‍රයාට කොපමණ තරම් බරක් දැරීමේ ශක්‍යතාවක් තිබේ ද?

IV. 'ගිණි දඬු' , 'පසුඹී පයිය' යන වචනවලට අර්ථ සපයන්න. ( ලකුණු 04 යි.)

(ඉ) මනාව වට වූ තොපගේ දණ මඬල දෙක රන් මුහුදෑ පැන නැගී රනිබ්බන් දෙදෙනෙකු මෙන් ඉතා හොබනේ ය. තව ද තොපගේ මටසිලිටු වූ පිරිපුන් කලවා සඟළ රන් කෙහෙල් කඳ දෙකක් මෙන් ඉතා සිත්කලු ය. මිටින් ගත හැකි තොපගේ සිඟුවලඟ රන් සිරිවසක් මෙන් ශෝභාමත් වන්නේ ය. තව ද තොපගේ මධ්‍ය මාංගයේ රැළි දිදී සිටියා වූ හිරිතුන වසාරොද නමැති ජාල ඇති රූප නමැති සාගරයෙහි පැන නැගී රළ පතර තුනක් මෙන් දිලිහෙයි. තව ද ස්වර්ණ සාගරයෙන් පැන නැගී රන් බුබුළු දෙකක් හා සමාන වූ තෙල පයෝධාරයෝ දෙදෙන තොපගේ රූප සම්පත් නමැති මහා මුහුද හොබවති.

I. මෙසේ වර්ණනාවට පාත්‍ර වන්නේ කවුරුන් ද?

II. ඡේදයේ මූලික වශයෙන් දැකිය හැකි අර්ථාලංකාරය කුමක් ද?

III. "....රන් සිරිවසක් <u>මෙන් ශෝභාමත්</u> වන්නේ ය."

ඉරි ඇඳි පද අයත් ව්‍යාකරණ අංග හා අනු අංග දක්වන්න.

IV. 'සිඟුවලග' , 'පයෝධර' යන වචනවල තේරුම ලියන්න. ( ලකුණු 04 යි.)

(ඊ) වටින නොයෙක් බඩු අරගෙනැ ඇම දාම
වටින මිලට නොවිකුටැ කොටැ වෙළදාම
සිටින ලියන් දැකැ සිහි කැරැ බණ දාම
වඩින කොන්ගස් සෙවණේ නො රඳාම

ගවසා සුනිල් වරලසැ කුසුම පටියෙන
වෙහෙසා තතන තන රන තිසර පැටියෙන
සහසා දිවෙන ලිය දැකැ තැවෙන අටියෙන
නොලසා මිතුර යා-ගැන නොසිට යටියන

I. ගිරවාට බණ දහම් සිහි කර යන්නට යැයි පවසන්නේ කුමක් නිසා ද?

II. කෙස් කළඹ සරසාගෙන ඇත්තේ කුමකින් ද?

III. පූර්වෝක්ත පද්‍යයන්හි සඳහන් නගර දෙක කුමක් ද?

IV. 'නොවිකුට' , 'නොලසා' යන වචනවල තේරුම් ලියන්න. ( ලකුණු 04 යි.)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

I. 'විචාරාත්මක කම් ඇත්නම් අන්‍යාය මෙලෙස නො පවතී.'

II. 'තොපගේ අදහස විශාරද නියාව ආදී නොහැගුණත් දැනුත් නොහැගේ ද?'

III. 'මම මේ ආත්ම භාවයෙහි අනෙක් කෙනෙකුන් සේව ගියෙමි.'

IV. 'ඇයි එහෙම කියන්නේ? ඉගෙනගෙන බලන්න එපා ය'

V. ‘ඒක කවදාහරි ප්‍රයෝජන වෙනඩ පුළුවන්.’

VI. ‘එහෙම නෙවෙයි. ඔයාගේ ඔක්කොම නම කියන්න.’ ( ලකුණු 08 යි.)

(ඉ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

පඩි පෙළින් උඩගු කළ මහා ගෙදර ආලින්දෙ
ලී කුලුණු යා කරන ලීස්තර වට මැදින්
නෙත් හෙළමි අදත් මම කුඩා දරුවෙකු ලෙසින්
පාලුවෙන් පුරන් වූ ඇත වෙල් එළිය වෙත

මෝස්තර කැටයමින් බැබළෙනා ලී පටි ද
අලුත් බීරලු සේ ම දිලෙන සම දා සුදු ද
වට කළේ ජීවිතය බෝධි කොටුවක් ලෙසින්
සැම දේ ම මා දුටුවේ ලීස්තර වැට මැදින්

පාන ළඟ වැඳ වැටෙන අම්මගේ මුව මඬල
පසුපසින් පෙළ ගැසෙන නැඟණියන්ගේ පිළිම
සැදෑ එළියේ ඇදෙන සංසාර සෙවණැල්ල
බලා සිටියෙමි තනි ව ලීස්තර වට මැදින්

වසරකට වතාවක් පිළිසකර කර වැට ම
පාට ගෑවේ සුදට සාර්ලිස් බාස් විත්
මගේ සිත අලුත් වී ලීස්තර වැට සමඟ
අමුතු එළියක් වැටිණ එවිට මිදුලට සිතට

මා අවට ගලා ගිය ජීවිතය දෙස නිතර
සුදු ලීස්තර මැදින් බලා සිටියා මිසක
උස පිලෙන් බිමට බැස ඒ දිවිය වෙත එළඹ
වෙළෙන්නට ගැටෙන්නට හරස් විය මේ වැට ම

පාළුවෙන් පුරන් වූ ඇත වෙල් එළිය මෙන්
මගේ සිත පුරන් වී ඇත මෙදින ශෝකයෙන්
කොළ හැලුණු මීදුල මත නගා සර සර හඬක්
පාන් පැල ළඟට යන අම්මාගේ සේයාව
සැදෑ එළියේ ඇඳෙන සංසාර සෙවණැල්ල
බලා සිටිනෙමි අදත් ලීස්තර වැට මැදින් ( ලකුණු 16 යි.)

2. කථා වස්තුවල රසය පවත්වාගැනීම සඳහා ධර්මසේන හිමියන් උපහාසය යොදාගත් ආකාරය නියමිත කථා වස්තු ඇසුරෙන් සාකච්ඡා කරන්න. ( ලකුණු 15 යි.)

නැතහොත්,

‘ චංචල මෙන් ම ව්‍යාකූල මනුෂ්‍ය චිත්ත ස්වභාවයන් නිරීක්ෂණය කොට, ඒ තුළින් ගැඹුරු ජීවිත පරිඥානයක් . ලබාදීම ජාතක කථාකරුවාගේ අභිප්‍රාය විය.’ නියමිත ජාතක කථා දෙකක් ඇසුරෙන් විමසන්න. .
( ලකුණු 15 යි.)

3. ‘ධර්මානුකූලව දන් දීමේ ආනිශංස හුවා දක්වමින් හුදී ජනයා දහමට යොමු කිරීම සද්ධර්මාලංකාර කතුතුමාගේ මුඛ්‍ය අරමුණයි.’ නිර්දිෂ්ට කථා වස්තු ඇසුරෙන් විමසන්න. (ලකුණු 15යි)

4. අවස්ථාවෝචිත විරිත් පරිභාවිත කිරීමෙහිලා ගිරා සන්දේශකරුවා දැක්වූ සාමාර්ථ්‍යය සුදුසු පද්‍ය තුනක්වත් ඇසුරෙන් විභාග කරන්න. ( ලකුණු 15 යි.)

5. ‘කේන්ද්‍රීය චරිතයන්හි ගති ස්වභාවය හා ආධ්‍යාත්මික ස්වරූපයන්ගේ පරස්පරතා සහිතව “මළගිය ඇත්තෝ” නවකථාව නිර්මාණය වී තිබීම සුවිශේෂත්වයකි.’ විමර්ශනය කරන්න. ( ලකුණු 15 යි.)

6. ධනේශ්වර පන්තියේ සම්භාවනීය ජීවිත පිටුපස ඇති අසම්මත චර්යාවන් කුතුහලය දැනවෙන පරිදි විවරණය කෙරෙන කෙටිකතාවකි; "සාක්කි තුනක්" සුදුසු උදාහරණ දක්වමින් විමසන්න. ( ලකුණු 15 යි.)

7. දාරක ස්නේහය විශද වන අයුරින් පද්‍ය බන්ධනයෙහිලා නූතන පද්‍යකරුවන් උත්සුක වී ඇති ආකාරය සුදුසු පද්‍යපන්ති ඇසුරෙන් සාකච්ඡා කරන්න. ( ලකුණු 15 යි.)

8. රත්නාවලී නාටිකාවේ සාර්ථකත්වයට විදූෂකගේ චරිතය බලපාන ආකාරය නාට්‍ය පෙළ ඇසුරෙන් නිදසුන් දෙමින් පහදන්න. ( ලකුණු 15 යි.)

සැකසුම:- මහේෂ ද අල්විස්